ආසියාවේ පළවන එකම කතෝලික ළමා පුවත් පත
LP - QD / 118/ News/ 2011

# ළමා ප්‍රදීපය

ක්‍රි. ව. 2011 නොවැම්බර් 14 සඳුදා
04 වෙළුම - 04 කලබ
සතිපතා පත්‍රය - පිටු 16
මිල රු 10.00



## දොන් බොස්කෝ මුනිඳුන් සිහිපත් කැරෙන විශේෂ සමය ඇරඹුනා

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් pradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.lk

# ශුද්ධවූ ජෝන් බොස්කෝ මුනිතුමා

## ආදරණීය දුවේ පුතේ...

අද අපි කථා කරන්නට යන්නේ මේ දිනවල නිතරම කථා බහට ලක් වන සාන්තුවරයෙක් පිළිබඳවයි. මේ වනවිට ඔබත් දන්නවා ඇති මේ සාන්තුවරයාගේ ශුද්ධවූ දේහය අඩංගු මංජුසාව මේ මස 19 වන සෙනසුරාදා ඉන්දියාවේ චෙන්නායි නුවර සිට ශ්‍රී ලංකාවට වැඩම කරන්නට සියලු කටයුතු සූදානම් කර ඇති බව. මේ සාන්තුවරයා තමයි ශුද්ධවූ ජෝන් බොස්කෝ මුනිතුමා. සමහර අවස්ථාවලදී මෙම සාන්තුවරයාව හඳුන්වන්නේ දොන් බොස්කෝ තුමන් කියලයි.

ඉතිං දොන් බොස්කෝ තුමන්ගේ ජීවිත කථාවට පිවිසෙන්නට පෙර මෙතුමන්ගේ ශ්‍රී දේහය ලංකාවට වැඩම කිරීම සම්බන්ධයෙන් මතක් කිරීමක් කළ යුතුයි. පුරා දින 11ක් තිස්සේ ශ්‍රී ලංකාවේ පදවි 09 කටම මෙම ශ්‍රී දේහය වැඩම කරනවා. ඉන්පසු මේ මාසයේ 30 වන දා ශ්‍රී දේහය නැගෙනහිර අප්‍රිකාවේ කෙන්යාව බලා රැගෙන යාමට නියමිතයි.

ආදර දුවේ පුතේ, දොන් බොස්කෝ මුනිතුමා උපත ලැබුවේ 1815 අගෝස්තු 16 වන දින ඉතාලියේ ටියුරින් නුවර බෙක්කි කියන කුඩා ගම්මානයේයි. ඉතාම කුඩා අවධියේදී දොන් බොස්කෝ තුමන් හට තමන්ගේ පියා අහිමි වෙනවා. කුඩා කාලයේ පටන්ම ඉතාමත් ඇඩි ආදරයෙන් එතුමන්ට රැක ගන්නේ එතුමන්ගේ මෑණියන්වූ මම්මා මාග්‍රට් තුමියයි. එතුමියත් අද ශුද්ධවූ සභාවේ සාන්තුවරියක් බවට පත්වී තිබෙනවා. ඉතාම දිළිඳු ජීවිතයකට උරුමකම් කියූ මේ දොන් බොස්කෝ තුමන් තමන්ට වයස 9 ක් පිරෙන අවධියේදි දේව කැඳවීම පිළිබඳව ගැඹුරු හැඟීමක් ඇති කර ගන්නවා. කුඩා කාලයේ පටන්ම එතුමන්ගේ ජීවිතයේ ප්‍රබල ආදර්ශය වූයේ මරිය වහන්සේයි.

හොඳ හැදියාවකින්, මනා චරිතවත් විනයකින් හා ගැඹුරු අධ්‍යාත්මයකින් සපිරි දොන් බොස්කෝ තුමන් තමන්ගේ ජීවිත මාර්ගය යහපත් අයුරින් සකසා ගෙන ක්‍රි.ව. 1841 ජුනි මස 05 දින පූජකවරය හිමි කර ගන්නවා. ඒ වසරේම දෙසැම්බර් 08 වන දින බර්තලෝමියු ගරෙල්ලි නම් යෞවනයා තුළින් ආරම්භ වූ යෞවන ආත්මයන් ගලවා ගැනීමේ සේවාව ක්‍රමිකව ව්‍යාප්ත වෙන්නට පටන් ගත්තේ දොන් බොස්කෝ තුමන්ගේ අප්‍රතිහත ධෛර්යය හා අපූර්ව ජ්වලිත දැහැමියාව නිසාමයි. අද වන විට සැලේසියානු නිකාය හරහා රටවල් 130 ක මෙම සේවාව ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

ආදර දුවේ පුතේ, දොන් බොස්කො මුනිතුමන් ජීවත්වූ මේ කාල වකවානුවේ ඉතාමත්ම ඉහලින් විරැකියාව, දිළිඳු බව, පාපී බව හා යෞවන ජීවිත අඩාල වීම් බහුල වශයෙන් පැවතියා. දොන් බොස්කෝ තුමන්ට ඇඩි ආශාවක් හා කැපවීමක් මේ සමයේදී ඇති වෙනවා, මේ යෞවනයන්ව මුදා ගැනීම සම්බන්ධයෙන්. දොන් බොස්කෝ මුනිතුමන් ඒ අනුව ක්‍රියා කරමින් ශු. පිලිප්නේරි මුනිතුමන්ගේ ආදර්ශ පාඨය උපයෝගි කර ගන්නවා. ඒ තමයි, "දුවන්න, පනින්න, නටන්න, ගයන්න, වයන්න, රඟන්න... එහෙත් පවු නොකරන්න..... අන් සියල්ලක්ම ඔබ ගන්න - ආත්මයන් පමණක් මට දෙන්න" කියන ඉතාම ලස්සන ආදර්ශ පාඨය. මරියෝත්තමාවන්ගේ මැදිහත් කමේ ඇඩි ප්‍රබල ශක්තියක් සමඟ යෞවනයන් දිනා ගැනීමේ මෙහෙයුම ආරම්භ කරන්නේ 1874 අප්‍රියෙල් 04 වන දායි. එදින තමයි දොන් බොස්කෝ මුනිතුමන් සභා අනුමැතිය අනුව යමින් සැලේසියානු නිකාය ආරම්භ කරන්නේ. මේ වනවිට මෙම සැලෙසියානු නිකාය පැවිදි නිකායක් ලෙසින් ලෝකයේ බොහෝ රටවල යෞවනයින් සුමඟට ගැනීමට හා විධිමත් අධ්‍යාපන ක්‍රම වේදයකට යොමු කිරීමට ඇඩි උත්සාහයක් සමඟින් කැපවී සිටිනවා.

ආදර දුවේ පුතේ, අප ශ්‍රී ලංකාව තුළත් සැලේසියානු නිකායේ ගරු පියතුමන් බොහෝ කැපවීමෙන් යෞවනයින් උදෙසා සේවාව කැප කොට තිබෙනවා. 1956 දී ගරු හෙන්ද්‍රි රෙමරි පියතුමා තමයි ශ්‍රී ලංකාවේ සැලේසියානු නිකාය ආරම්භ කලේ. මේ වනවිට ශ්‍රී ලංකාවේ පදවි 09 ක මෙම නිකායේ පියතුමන් සේවය කරනවා. කාර්මික විද්‍යාල, හෝටල් පාසල්, වෘත්තිය පුහුණු මධ්‍යස්ථාන, අනාථ නිවාස ආදි අයුරින් විවිධ තලයන් වල සේවා කටයුතු කරන මෙම පියතුමන්ලා අප දේශයේ ශුද්ධවූ සභා මාතාවන් ඉටු කරන්නේ ඉමහත් සේවාවක්.

දොන් බොස්කෝ මුනිතුමන් ඉපදී වරස 200 ක් ගත වන විට මේ සමයේදී වඩාත් එතුමන් ගැන දැනුවත් වන්නට ඔබත් උත්සාහ කරන්න. අප දේශයට වැඩම කරවන එතුමන්ගේ ශ්‍රී දේහය දැක බලා ගන්නට පුංචි ඔබත් උත්සාහ කරන්න. විශේෂ කොට කතෝලික යෞවනයින් තුළින් දේව රාජ්‍යය උදා කර ගන්නට කරන කැපවීමට පුංචි ඔබත් දායක වන්න.

ඔබ සැමට ජේසු පිහිටයි !

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

# ජාතික කතෝලික ලේඛක හවුලේ 2011 සාහිත්‍ය තරගාවලියේ ළමා නිර්මාණ අංශයේ ජයග්‍රාහකයෝ

## ළමා නිර්මාණ 5-9 ශ්‍රේණි

**1 ස්ථානය**
එස්.එම්.ඩී. කේෂාන් තත්සර සේතුංග
- ජෝශප් වාස් ම.ම. විද්‍යාලය - වෙන්නප්පුව.

**2. ස්ථානය**
එම්.ඩී.ඩබ්ලිව් රුවනි මධුෂානි සමරජීව
- සා. ජෝශප් විද්‍යාලය - කොලොන්නාව.

**3 ස්ථානය**
ඇජ්ඩ්‍රියා නතාලි සෙත්
- සා. ලෝරන්ස් කන්‍යාරාමය - වැල්ලවත්ත.

## ළමා නිර්මාණ 5-9 ශ්‍රේණි (පද්‍ය)

**1 ස්ථානය**
සුරන්ති ජයකොඩි - සා. බ්‍රිජට් කන්‍යාරාමය කොළඹ 07.

**2 ස්ථානය**
එල්. අනුෂික දෙව් විදර්ශනී
- සා. ජෝශප් දහම් පාසල - දංකොටුව.

**3 ස්ථානය**
ධෂාත් උදාර රාජපක්ෂ
- සා. ජෝශප් දහම් පාසල - දංකොටුව.

## කෙටිකතා කනිෂ්ඨ

**1 ස්ථානය**
මිෂෙල් ඇන් කෙලාට්
- සා. ජෝශප් දහම් පාසල කොළොන්නාව.

**2 ස්ථානය**
- කේ.ඩී. නෙත්මි භාග්‍යා සිරිවර්ධන
ශු. පවුලේ කන්‍යාරාමය - කළුතර.
- ආර්.ඒ. ඉෂර ලක්ෂිත
- සා. ජෝශප් දහම් පාසල - දංකොටුව

## රචනා 9 -11 ශ්‍රේණිය

**1 ස්ථානය** -
මේරියන් ශනුකි ප්‍රනාන්දු තුඩැල්ල

**2 ස්ථානය** -
ඇන්ඩ්‍රියා නතලි සෙත් - රාජගිරිය.

**3 ස්ථානය** - ඩබලිව්. දිලනි චතුරංගි - වටිනාපහ.

## රචනා 12-13 ශ්‍රේණි

1. කෝෂිලා සජානි පෙරේරා
- සා. සෙබස්තියන් මහ විදුහල කඳාන.
2. නවංජනි තාරිකා ප්‍රනාන්දු
- දංකොටුව බාලිකා මහ විද්‍යාලය.

## අගරදගුරු පදවි ධර්මදූත සජීවක ප්‍රථම පුහුණු කඳවුර තේවත්තේදී...

අගරදගුරු පදවි ධර්මදූත සජීවක සජීවිකාවන්ගේ ප්‍රථම පුහුණු කඳවුර තෙදිනක් පුරා රාගම තේවත්ත ඥානකාන්ති ගෘහයේ දී පැවැත්වුණි. මෙම මෙහෙයට දිසා 13 ක නව සජීවකයන් බොහෝ පිරිසක් සහභාගි විය. එහි දී ධර්මදූත ළමා සමාජය මෙහෙයවිය යුත්තේ කෙසේද ? සජීවක මගේ අධ්‍යාත්මය, නූතන මාධ්‍ය ධර්මදූත මෙහෙවර සඳහා යොදා ගත යුත්තේ කෙසේද වැනි හරවත් දේශනා හා ක්‍රියාකාරකම් තුළින් ළමුන්ව දැනුවත් කිරීමට ධර්මදූත සංගම් ජාතික අධ්‍යක්‍ෂ ගරු රෙජිනෝල්ඩ් සපරමාදු, පදවි අධ්‍යක්‍ෂ ගරු කිත්සිරි තිරිමාන්න, ගරු හෙන්රි සිල්වා, ගරු ලලිත් එක්ස්පෙඩිටස් යන තුමන්ලා හා ඥානාර්ථ ප්‍රදීපය සහය සංස්කාරක ශිරාන් මෛත්‍රී මහත්මා ද දේශකයින් ලෙස සහභාගී විය.

**ධර්මදූත පදවි කාර්යාලය**
**කොළඹ අරගදරගුරු මැදුර**

## මොරටු දිසා ධර්මදූත ළමා සමාජීය නත්තල් කැරොල් ගායනා තරඟ ප්‍රතිඵල

මොරටු දිසාවෙන් ධර්මදූත ළමා සමාජීය පදවි නත්තල් කැරොල් තරගයට ඒකකයක් තෝරා ගැනීමේ අරමුණින් සංවිධානය කළ කැරොල් තරගය පසුගියදා මොරටුව මීසම් ජුබිලි ශාලාවේදී පැවැත්වුනි. තරග ප්‍රතිඵල මෙහි දැක්වේ.

**(1-2-3 ශ්‍රේණිය)**

**1 වන ස්ථානය** - කඩලාන ඒකකය **2 වන ස්ථානය** - වලාන ඒකකය
**3 වන ස්ථානය** - කටුකුරුන්ද ඒකකය

**(4-5-6 ශ්‍රේණිය)**

**1 වන ස්ථානය** - කඩලාන ඒකකය **2 වන ස්ථානය** - මොරටුව ඒකකය
**3 වන ස්ථානය** - කඩලාන ඒකකය

**(7-8-9 ශ්‍රේණිය)**

**1 වන ස්ථානය** - කටුකුරුන්ද ඒකකය **2 වන ස්ථානය** - කඩලාන ඒකකය
**3 වන ස්ථානය** - කඩලාන ඒකකය, මොරටුව ඒකකය

**අසික ප්‍රියදර්ශන - සභාපති මොරටු දිසා ධර්මදූත ළමා සමාජය**



## ජේසුගෙන් ළමා ඔබට

# ජාකොබ්ගේ විශ්වාසය

**ජාකොබ් දෙවිඳුන් කෙරෙහි තැබූ අචල විශ්වාසය නිසා උන්වහන්සේ ලාබන්ගෙන් ඔහු මුදා ගත් සේක. ඔබත් දෙවිඳුන් හා විශ්වාසයෙන් ගමන් කරන විට උන්වහන්සේට කීවත් නැතත් ඔබගේ ගමන් බිමන් හා දුක් කරදර අවස්ථාවන්හිදී ඔබ සමග සිට ඔබට ආශිර්වාද කරන සේක.**

ආබ්‍රහම්ගේ විශ්වාසය මෙනෙහි කළ අපි ජාකොබ් දෙවිඳුන් සමග විශ්වාසයෙන් ගමන් කළ ආකාරය පිළිබඳව අද බලමු.

දේව සැලැස්මට අනුව තම පියා වන ඊසාක්ගේ ආශිර්වාදය ලබා ගත් ජාකොබ්ව ද දෙවි පියාණන් වහන්සේ තම ගැලවීමේ සැලැස්ම ඉදිරියට ගෙන යාම සඳහා තෝරා පත් කළ නායකයෙකි. ඔහු තම ජීවිතයේ ප්‍රධාන සන්ධිස්ථානයන් හි දී මුළුමනින්ම විශ්වාසය තැබුවේ ආබ්‍රහම් විශ්වාසය තැබූ දෙවිඳුන් තුළමය. උදාහරන ලෙස ඔහු ගෙදරින් පලා ගිය අවස්ථාව, විවාහය සඳහා සේවය කළ අවස්ථාව, නැවත ගෙදරට පැමිණෙන විට මුහුණ දුන් සිදුවීම් සඳහන් කළ හැක. දෙවිදාණෝ සැමවිටම ඔහු සමග විය.

එක් දිනක් තම මාමණ්ඩිය වන ලාබන්, තරහෙන් ඔහු පසුපස ලුහු බැන්දේය. එහිදී දෙවිදාණෝ ලාබන්ට මෙසේ වදාළ සේක. "ඔබ ජාකොබ්ට කිසිවක් නොකියන ලෙස වග බලා ගන්න...." (උත්. 31/24) එවිට ජාකොබ් මෙසේ කීවේය.

"මාගේ පියාගේ දෙවියන් වහන්සේ මා සමග නොසිටි සේක් නම් ඔබ (ලාබන්) දැන් මා හිස් අතින් පිටත් කර හරිනවා. සිකුරුයි. එහෙත් දෙවියන් වහන්සේ මගේ දුක් පීඩාවක්, මගේ අත්වල ශ්‍රමයත් දැක ඊයේ රෑ ඔබට තරවටු කළසේක."

ජාකොබ් දෙවිඳුන් කෙරෙහි තැබූ අචල විශ්වාසය නිසා උන්වහන්සේ ලාබන්ගෙන් ඔහු මුදා ගත් සේක. ඔබත් දෙවිඳුන් හා විශ්වාසයෙන් ගමන් කරන විට උන්වහන්සේට කීවත් නැතත් ඔබගේ ගමන් බිමන් හා දුක් කරදර අවස්ථාවන්හිදී ඔබ සමග සිට ඔබට ආශිර්වාද කරන සේක. ඔබව ආරක්ෂා කරන සේක. ඔබට මග පෙන්වන සේක. ඔබත් උන්වහන්සේව අදහා ගෙන, කීකරුව ජීවත් වන්න.

**ජාකොබ් තුමාගේ ජීවිත ගමන පිළිබඳව දැන ගැනීම සඳහා උත්පත්ති 31 පරිච්ජේදය කියවන්න.**

**ගරු ශිරෝමා ප්‍රනාන්දු පැවදි සොයුරිය**

# මීගමුව ආවේ මරියා බාලිකා විදුහල් ක්‍රීඩිකාවන්ට සමස්ත ලංකා ටෙනිස් ශූරතාවයක්



ශ්‍රී ලංකා ටෙනිස් ආයතනය සංවිධානය කළ ටෙනිස් තරගාවලිය කොළඹ ශ්‍රී ලංකා ටෙනිස් ආයතන ක්‍රීඩා පිටියේදී පැවත්වුණි. මෙහිදි රතු බෝල් කාණ්ඩයේ සමස්ත ලංකා ශූරතාවලිය මීගමුව ආවේ මරියා බාලිකා විදුහල දිනා ගන්නා ලදී. මෙහිදී දක්ෂතම ක්‍රීඩිකාව බවට පත්වූයේ ඇන්ජලිකා කුරේරා ක්‍රිඩිකාවයි. මෙහි ක්‍රීඩා පුහුණු කරු ලෙස ටී. පහීකරන් මහතා කටයුතු කරයි.

විදුහල්පතිනි ගරු ප්‍රැන්සීන් මුතුගල පැවිදි සොහොයුරිය සමග ජයග්‍රාහී ක්‍රීඩිකාවන් ක්‍රීඩා භාර ආචාර්ය පුෂ්පා පෙරේරා මහත්මිය සමග ළමා ප්‍රදීපය සඳහා සමුහ සේයාරුවකට මුහුණ දුන් අයුරු.

**රේමන් අපෝන්සු**



**මාසික සිතිවිල්ල**

සේයා : ටී. සුනිල් ප්‍රනාන්දු

මෙහි පළ වන සේයාරුවට ගැලපෙන පරිදි ඔබගේ අලංකාර ගද්‍ය හා පද්‍ය නිර්මාණය අප වෙත යොමු කරන්න. ඔබ එවන නිර්මාණය සමග ඔබේ නම, ලිපිනය, ශ්‍රේණිය, පාසල, දහම් පාසල හා දුරකථන අංකය ද පැහැදිලිව ලියා පහත ලිපිනයට යොමු කරන්න.

මාසික සිතිවිල්ල, "නොවැම්බර් මාසය"
ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත,
කොළඹ 08.

# කැප කරන්නම්, දිවියම ඔබේ නමට



ජේසුනි,
ධනය, බලය, මුදල සොයනා ලොව තුළ
සෙව්වෙමි මම ද එය සමිඳුනී,
සම්බවුව ද පැතුව සැමදේ
හිස් බවකි මගෙ ජීවිතේ
දිවියේ හිස් බව නැති කරන්නට,
පිය නැගුණි දෙපයම
අභියසට ඔබගේ,
එදා සකෙවුස් මෙන්
පවුකරුවෙකු වී හෝ
ඔබේ සෙනෙහබර දෑස් හමුවේ,
ඔබේ ආදරය අත්දකින්නට
තිබුණා නම්, මා ජීවිතය පූර්ණයි ස්වාමිනි....
අසම්පූර්ණ ජීවිතය පූර්ණයි කර ගන්නට
අරුතක් නැති දිවියට අරුතක් සොයාගෙන
ඔබට කැප වන්නට ආවෙමි මා....
භාර ගන්න සමිඳුනි, වෙලා ගන්න සමිඳුනී,
ඔබේ ආදර රැකවරණයෙන් මුළු දිවියම මාගේ...

**එස්. ශෂිනි නදීෂා**
**10 ශ්‍රේණිය, සා. ඉසිදෝරු දහම් පාසල - තිබ්බටුගොඩ**

**තිබ්බටුගොඩ සා. ඉසිදෝරු දහම් පාසලේ 7, 8, 9, 10, 11 ශ්‍රේණි වල ළමුන් සඳහා පැවැත්වූ ළමා ලේඛක වැඩමුළුවේ ලේඛක අභ්‍යාසයේ ජයග්‍රාහි නිර්මාණයන්...**

# පැවිදි දිවිය

සැඩ සුළඟක් පැමිණ,
දූවිල්ල ගසා ගෙන ගියත්,
වතුර බිඳුවක් පැමිණ,
අපට රහසක් කීවත්,
කවද හෝ මෙවැනි වේලාවක,
ඒ දූවිල්ලටත් පුංචි වැසි බිඳුවටත්,
නොකියා ජේසු එක්ක,
ඉන්න යන මේ දිවිය,
පර්වතකයක් දෝ යි මා හට හැගේ.....

**ඒ. සදුනි උරේෂිකා**
**11 ශ්‍රේණිය,**
**සා. ඉසිදෝරු දහම් පාසල,**
**තිබ්බටුගොඩ**

# ආදරයේ උල්පත



*ජීවිතය සයුරක් නම්*
*එහි රළ අම්මා....*
*ජීවිතය මලක් නම්,*
*එහි සුවඳ අම්මා...*
*ජීවිතය කන්දක් නම්,*
*එහි නැග්ම අම්මා...*
*ජීවිතය නැවක් නම්*
*එහි සුක්කානම අම්මා...*
*ජීවිතය ගසක් නම්*
*එහි ඵලය අම්මා...*
*ජීවිතය ආදරය නම්*
*එහි උල්පත අම්මා...*

**සුබෝධා ප්‍රසාධිනි**
**9 ශ්‍රේණිය,**
**ශු. ඉසිදෝරු දහම් පාසල**
**තිබ්බටුගොඩ**



## දිව බොදුනින් පෝෂණය වෙමු

**ගීතිකා උදානි**
**12 ශ්‍රේණිය,**
**සිරිකුරුස විදුහල,**
**ගම්පහ**
**(තිබ්බටුගොඩ මීසම)**

# වැස්ස

වැහිලිණියෝ පියා සලයි
ගෙම්බෝ මහ හඬ තලයි
මුළු අහසම කළු කරයි
මහ වැස්සක් එනව වගෙයි

අහසේ රත්‍රන් ඉරි යයි
මොරගෙඩි මෙන් වැස්ස වැටෙයි
ඩෝං හඬින් හෙණ පුපුරයි
මගේ සිතට බිය ගෙන දෙයි

**රුසිරු මිහිෂ**
**7 ශ්‍රේණිය,**
**සා. ඉසිදෝරු දහම්පාසල,**
**තිබ්බටුගොඩ**

# 2011 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

**II කොටස - ආදර්ශ ප්‍රශ්න පත්‍රය**

01. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
   1. පුරාණ ගිවිසුමේ යාච්ඤාව පිළිබඳව විශිෂ්ටතම කෘතිය කුමක් ද ?
   2. මෙසියස් වහන්සේට “එම්මානුවෙල්” යන නාමය දෙන ලද්දේ කවුරුන් ද ?
   3. පැරණි ගිවිසුමේ පූජකවරු ජනතාව වෙනුවෙන් කළ යුතුකම් දෙකක් ලියන්න. ශුද්ධවූ සභාවේ පළමුවන දේව පණත ලියන්න.
   4. දේව මෑණියන් හා සම්බන්ධ ණය මංගල්‍යයන් දෙකක් නම් කරන්න.
   5. දේව අනාවරණයේ සුලමුල කුමක්ද ?
   6. සුවදානයේ දේව ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.
   7. සමාජීය දේව ප්‍රසාද නිධාන දෙක නම් කරන්න.
   8. දෙවන වතිකානු මන්ත්‍රණ සභාවේ වර්තමාන ලෝකයේ ශුද්ධවූ සභාව නමැති ප්‍රකශනයේ කිතුනු පවුල හඳුන්වන නම කුමක්ද ?
   9. නව ගිවිසුමේ නිල පූජකවරය දානය කිරීම අඛන්ඩව පවත්වාගෙන ගිය බව තහවුරු කරන සිද්ධිය නම් කරන්න.

   (එක් කොටසකට ලකුණු 02 බැගින් 02 x 10 = 20)

02. 1. උත්පත්ති පොතේ පළමු මැවීමේ කථා පුවත සහ දෙවන මැවීමේ කථා පුවත අයත් වන සම්ප්‍රදායයන් දෙක නම් කරන්න.
   2. දේව සමානකමට මැවූ මිනිසකු වශයෙන් ඔබ සතුවූ ගුණාංග තුනක් නම් කරන්න.
   3. දෙවියන් වහන්සේගේ කැඳවීමට අනුව ජීවත් වන නව යොවුන් වියේ පසුවන්නකු වශයෙන් ඔබ මුහුණ පාන ගැටළු පහක් නම් කරන්න.

03. 1. ජේසුස් වහන්සේ නාසරත් නුවරට පැමිණ සබත් දිනයේ දී ධර්මශාලාවට වැඩම කර කියවන ලද ග්‍රන්ථය නම් කරන්න.
   2. ජේසුස් වහන්සේ නාසරතේ නුවර ධර්ම ශාලාවේ දී කරන ලද දේශනාවට අනුව ජේසුස් වහන්සේගේ ප්‍රධාන දූත කාර්යයන් තුනක් නම් කරන්න.
   3. ප්‍රසාද ස්නාපනය තුලින් ක්‍රිස්තු ශ්‍රාවකත්වයට කැඳවූ ඔබට වර්තමාන සමාජයේ දී මුහුණ පාන්නට සිදුවන අභියෝගවලට විරුද්ධව ඔබ ක්‍රියා කරන්නේ කෙසේද ? ප්‍රධාන කරුණු පහක් ඇසුරින් පැහැදිලි කරන්න.

04. 1. ආශිර්වාදකාර බන්ධනයේ දී මනාලයා සහ මනාලිය එකිනෙකාට පොරොන්දු වන කරුණු දෙකක් ලියන්න.
   2. දෙවන වතිකානු මන්ත්‍රණ සභාවේ වර්තමාන ලෝකයේ ශුද්ධවූ සභාව නමැති ප්‍රකාශනයට අනුව විවාහයේ පරමාර්ථ තුනක් ලියා දක්වන්න.
   3. “ නාසරතයේ ශුද්ධවූ පවුල වර්තමාන කිතුනු පවුලට උතුම් ආදර්ශයකි.” මේ ඇසුරින් පාසලේ දෙමව්පිය දිනයේදී ඔබ විසින් සිදු කළයුතු කථාවක දී මතු කරන ප්‍රධාන කරුණු පහක් ගොනු කරන්න.

05. 1. සාධාරණ ලෙස වස්තුව උපයා ගත හැකි මාර්ග තුනක් ලියන්න.
   2. සදාතන ජීවිතය ලබන්නට කුමක් කළ යුතු දැයි ජේසුස් වහන්සේගෙන් ඇසූ පොහොසත් තරුණයාට උන්වහන්සේ දුන් අවසාන උපදෙස කුමක්ද ?
   3. “පෞද්ගලිකව යම් යම් දේ තමන් සතු කර ගැනීමට මනුෂ්‍යයාට අයිතියක් ඇති නමුත්, මුදල් ඉපයීම ජීවිතයේ එකම අරමුණ නොවිය යුතුය. මේ අදහස ජනතාව තුළ තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි ආදර්ශ පාඨ පහක් ලියන්න.

06. 1. තමා සිල්වත් යැයි සිතමින් අන් සැම දෙන හෙළා දුටු අය ගැන ජේසුස් වහන්සේ වදාළ උපමාව නම් කරන්න.
   2. ඔබ නම් කළ උපමාවට අනුව ජේසු ස්වාමීන් වහන්සේ යාච්ඤාව පිළිබඳව ඉදිරිපත් කළ ඉගැන්වීම් තුනක් ලියා දක්වන්න.
   3. ළමා නිවාසයක ජීවත් වන අනාථ ළමයින් වෙනුවෙන් උදෑසන ආගමික මෙහෙයේ දී ඔබ විසින් කරන යාච්ඤාවක් වචන 50 කින් පමණ ලියන්න.

07. පහත සඳහන් මාතෘකා දෙකක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.
   1. රතු මුහුද තරණය
   2. කාලයේ සලකුණු තුළ දේව අනාවරණය
   3. මංගල වාක්‍ය තුළින් මතුවන දේව රාජ්‍යයේ වටිනාකම්
   4. ශුද්ධවූ සභාවේ සුලක්ෂණය

පිළිතුරු ලබන සතියේ

**සැකසුම**
**කතෝලික අධ්‍යාපන සේවාව - අනුරාධපුර රදගුරු පදවිය**

**තිබ්බටුගොඩ සා. ඉසිදෝරු දහම් පාසලේ 7, 8, 9, 10, 11 ශ්‍රේණි වල ළමුන් සඳහා පැවැත්වූ ළමා ලේඛක වැඩමුළුවේ ලේඛක අභ්‍යාසයේ ජයග්‍රාහී නිර්මාණයන්...**




පාසල් නිවාඩුව ඇරඹීමත් සමග ගොයම් කැපීම ආරම්භ කළ අප ගම් වැසියන්ට අපගේ ගොයම් කැපීමේ දිනයට ආරාධනා කළේ අපගේ පියා විසිනි. එදින උදෑසන අවදී වූ අප විගසින් දිව ගියේ කුඹුර වෙතටය. යන විටත් කුඹුර රන්වන් කරලින් ඉතා චමත්කාරව බැබළෙන්නට විය.

ටික වේලාවක් යනවිට ගම් වැසියන් පැමිණ වෙල්යායේ ගොයම් කැපීමට පටන් ගත්හ. රන්වන් කරලින් බරව තිබූ වෙල්යාය ටික වේලාවකින් අපට දැක ගත නොහැකි විය. ගමේ ගැමියන් විසින් ඇඹුල ද රැගෙන දහවල වන විට ඉතා චමත්කාර අන්දමින් කුඹුර වෙත පිය නැගූහ. පසුව දවල් ආහාරය ගත් ගොවීහු නැවතත් රන්වන් කරල් කැපීමට පටන් ගත්හ.

ඒ අතර තුරුදී අපගේ කන් පිනවීම සඳහා බුම්මැඩිය ගසමින් ගෙවිලියෝ ගොයම් කැපීමේ ගී කියන්නට ද එය සවස් වන විට ගොයම් කැපීම අවසන් කර ගොවියෝ වී මලු පිරවීමට පටන් ගත්හ. තාත්තා විසින් අම්බරුන් දෙපල කුඹුර වෙත ගෙන ආවේ "ජක් ජක්" යන හඬ නගමිනි. රෑ යාම හෙවත් ගොම්මනද ලංවිය. ඒ වනවිට සියලු කටයුතු අවසන් කර බැඳ මලු නිවසෙහි ඇති වී බැස්ස තුළට රැගෙන ගියේ ඉතා අලංකාර අන්දමිනි. ඒ වනවිට පියාගේ මුහුණ සිනහවෙන් පිරී තිබුණු අතර විඩාබරව තිබිනි.

**මීනා මිනෝලි, 8 ශ්‍රේණිය. සා. ඉසිදෝරු දහම් පාසල - තිබ්බටුගොඩ**

## නාගොඩ, ශු. ස්නාවක ජුවාම් දහම් පාසල




නාගොඩ, කඳාන ශු. ස්නාවක ජුවාම් දහම් පාසලේ නවක ශිෂ්‍ය නායක, නායිකාවෝ 45 දෙනෙකු, පසුගියදා පදක්කම් පැළඳූහ. මීසම් පාලක ගරු රංජන් සිල්වා පියතුමන්ගේ ප්‍රධානත්වයෙන් මෙදින කටයුතු සිදු කෙරෙනි.

ගරු පියතුමා ශිෂ්‍ය නායක නායිකාවන් භාර නාගොඩ දොමිනික් කන්‍යාරාමයේ ප්‍රධාන මව්තුමිය ගරු කැලිස්ට්‍රා සියඹලාපිටිය පැවිදි සොයුරිය මෙයට සහයවූ දහම් ගුරුවරියන් සමග ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට මුහුණ දුන් අයුරු. **නිලංගිකා රොෂානි ලිවේරා**



**දිව බොඳුන් ලැබූ ළමුන්ගේ සේයාරූ එව්මේදී ...**

**ඔබ මීසමේ, දහම් පාසලේ, පාසලේ පළමුවරට දිව බොඳුන් ලබන ළමුන්ගේ සේයාරුව අප වෙත යොමු කිරීමේදී මේ කරුණු පිළිබඳව අවධානය යොමු කරන්න. අදාළ සමූහ සේයා රුව සමඟ එවන විස්තරය පැහැදිලිව ලියා එවන්න. එසේම ගරු පියතුමන්ලා ගේ හා පැවදි සොයුරියන්ගේ නම් ගම් නිවැරදිව සඳහන් කරන්න. දිව බොඳුන් ලැබූ ළමුන් සංඛ්‍යාව ද සඳහන් කරන්න. අප පළ කරනුයේ සමූහ සේයාරූ පමණක් බැව් කරුණාවන්තව සලකන්න. සංස්කාරක පියතුමා**

# බෝලවත්ත දිසා දෙව් පුද සේවක දරුවෝ දැනුවත් කෙරෙති !




බෝලවත්ත දිසාවේ මීසම්හි පූජා උදව් දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පසුගියදා නයිනමඩමේ දී පැවැත්වුණි. පූජා උදව් දරුවෝ නයිනමඩම, ගිංඔය පාලම අසල සිට නයිනමඩම සා. අන්තෝනි දෙව් මැදුර කරා පා ගමනින්, ශුද්ධවූ පාඨයන් ලියවුනු බැනරයන්ද ප්‍රදර්ශනය කරමින්, අලංකාර පෙරහැරකින් ගමන් ගත්හ. ඔවුන් සඳහා විශේෂ දිව්‍ය යාගයක් හලාවත පදවි අනුනායක අතිගරු පැට්‍රික් විජේසිංහ පියතුමන් විසින් සිදු කරනු ලදුව, ගරු ඇලෙක්ස් වීරසූරිය පියතුමා විසින් පූජා උදව් දරුවන් දැනුවත් කිරීමේ විශේෂ දේශණයක් පැවැත්විය. මෙහිදූ පූජා උදව් දරුවන් සැදැහැවත් සැමගේ දෙවියන් හා බැඳුනු (සබැඳියාවේ) මානසිකත්වය නොබිඳෙන අයුරින් ශුද්ධවූ අල්තාරය වටා හැසිරිය යුතු ආකාරය මනාව පැහැදිලි කර දුන් අතර තවද ඔවුන් දෙවියන් වහන්සේ විසින් තෝරාගත් කොටසක් බවත්, ශුද්ධවූ දෙයට ගරු භක්තිය නිතර පුද කළ යුතු බවත් මෙහිදී පෙන්වා දෙන ලදී. මෙයට දෙසිය විසිපහක් පමණ පූජා අදව් දරුවෝ එක් වූහ. මෙයට බෝලවත්ත දිසා පූජා ප්‍රසාදිවරුන්ද එක් වූහ. මෙම වැඩසටහන නයිනමඩම මීසමේ පියතුමන්ලා විසින් සංවිධානය කෙරෙනි.



**රුවිර පෙරේරා**

# සා. දොන් බොස්කෝ මුනිතුමා

## සා. දොන් බොස්කෝ මුනිතුමා

වර්ෂ 1815 අගෝස්තු මස 16 වන දින ඉතාලියේ ටියුරින් නුවර අසළ බෙක්කි ගම්මානයේ දොන් බොස්කෝ උපත ලැබීය. වයස අවුරුදු දෙක හමාරක් වන වියේදී තම පියා අහිමි වන ඔහු තම මව වන මම්මා මාග්‍රට් රැකවරණයේ හැදී වැඩුනි. දුප්පත්කම සහ දරිද්‍රතාවය කරපින්නාගෙන උපන් ඔහුට කුඩා කල පාසල් යාමට වරම් නොලැබුනි. ස්වොත්සහයෙන්ම ඉගෙනීමෙ කටයුතුවල නිරතවූ ඔහුට හොඳ මතක තබා ගැනීමේ ශක්තියක් තිබුනි. තම මව සමග දිව්‍ය පූජාවට යන ඔහු පියතුමාගේ දේශනය, සවස ජපමාලය උච්චාරණය කිරීමට ඒකරාශී වූ ලොකු කුඩා සැමට නැවත මතක් කර දුන්නේය. කුඩා දරුවකු ලෙස අසල්වාසින් එකරාශී කර ගැනිමට ඔහු විසින් සර්කස් සහ විජ්ජා උපයෝගි කර ගන්නා ලදී. වයස අවුරුදු 9 දී ඔහු දුටු සිහිනයක් මගින් පියතුමකු වීමේ අදහස ජනිත විය. ලතින් ඉගෙනීම සඳහා මීසම් භාර කොලොස්සෝ පියතුමා උදව් විය. වැඩිදුර අධ්‍යාපනය සඳහා කස්තෙල්නුවොවෝ නගරයට ගිය එහුට පොත්පත් ගැනීම සඳහා අර්ධ කාලීන සේවාවන් හි නිරත වීමට සිදුවිය. ඉගෙනීමෙ කටයුතු නිමවා දෙව් සත්හලට ඇතුල් වූ ඔහු 1841 ජුනි 5 වන දින පූජක වරම් ලැබීය.

විරැකියාවෙන් වෙලි නොයෙකුත් සමාජ විරෝධි ක්‍රියා වල නියැලි සිටි බොහෝ දෙනෙකුගේ නිවහන සිපිරි ගෙය විය. සිර ගෙවල් බැහැ දුටු දොන් බොස්කෝ, සිර දඩුවමින් පසු මෙම තරුණයන් ඒකරාශි කර වෘත්තිය පුහුණුවක් තුලින් ධාර්මික යහගුණයෙන් පිරි තමන්ට සහ රටට වැඩදායි තරුණ පරපුරක් ලොවට ආයාද කිරීමට කටයුතු කරන ලදී. මෙම සේවය අගය කිරීමක් ලෙස 1988 දී භාග්‍යවත් 2 වන ජුවාම් පාවුළු ශුද්ධෝත්තම පියතුමන් විසින් දොන් බොස්කෝ මුනිතුමා තරුණයන්ගේ පියා, ගුරුවරයා සහ සුමිතුරා ලෙස නම් කරන ලදී.

## ශුද්ධවූ ධාතුවක් යනු කුමක්ද ?

ශුද්ධවූ ධාතුවක් යනු ආගමික බහුමානයට ලක්වූ වස්තුවකි. එය ශුද්ධ වන්තයෙකුගේ නොදිරා පවතින ඇට කටු හෝ ඔහු විසින් පරිහරණය කරන ලද දේ විය හැක. ශුද්ධවූ ධාතුන්වල ඉන්ද්‍රජාලීය බලයක් නැති වුවත් මේවා ශුද්ධවන්තයෙකුගේ ජීවිතය තුළ විවිධාකාරයෙන් දෙවියන් වහන්සේ ක්‍රියා කරන ආකාරය විදහා පායි. ශුද්ධ වන්තයන්ගේ ජීවිත කාලය තුළ දේව ජනතාව දෙවියන් වෙත යොමු කළා සේම ඔවුන්ගේ මරණින් පසු ශුද්ධ වු ධාතුන් මගින් සැදැහැවත් ජනතාව දෙවියන් වහන්සේට ගරු කිරීමට ඔවුන් පොළඹවනු ලබයි.

දොන් බොස්කෝ මුනිතුමන්ගේ ශුද්ධවූ ධාතුව ලොව පුරා වන්දනා ගමනක නියැලීමෙන් සමස්ත ජනතාවට සහ උන්

## 2011 නොවැම්බර් මස 19 වන දින සිට



වහන්සේගේ විශේෂ ආදර කරුණාවට පාත්‍ර වූ තරුණ කැළහට දොන් බොස්කෝ මුනිතුමා දෙවියන් වහන්සේ ගෙන් අපට ලැබුණු තිළිණයක් ලෙසිත් තරුණ තරුණියන් දෙවියන් වෙත කිට්ටු කළ ශුද්ධ වන්තයෙකු ලෙස අද සමාජයේ ජීවත් වන අපට මහඟු ආදර්ශයකි. එතුමන්ගේ මැදිහත්කම තුළින් පිහිට ආරක්ෂාව අපි නිතර යදින අතර අපටත් එවන් බැතිබර වරප්‍රසාදයෙන් පිරි විශ්වාසවන්ත ජීවිතයක් ගත කිරීමට දෙවිඳුන්ගෙන් වරම් අයදිමු.

### 2011 නොවැම්බර් මස 19 වන සෙනසුරාදා

ශු. ධාතුව ඉන්දියාවේ චෙන්නායි නගරයේ සිට ශ්‍රී ලංකාවේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලට සපැමිණීම.

සුලු යාච්ඤා මෙහෙයක් සමග අරමුණු පැහැදිලි කිරීම සහ පිළගැනීමේ කතාවෙන් පසුව දුන්ගාල්පිටිය පාලනාධිපති නිවසට සපැමිණීම.

**ගමන් මග** - කටුනායක හන්දිය, අගරදගුරු මාවත, මීගමුව මහ වීදිය සාන්ත මරියා දෙව් මැදුර, පිටිපන ඔස්සේ දුන්ගාල්පිටියට සේන්දු වීම.

### 2011 නොවැම්බර් මස 20 වන ඉරිදා

පල්ලියවත්ත කාර්මෙල් දේව මාතා දෙව් මැදුර කරා ගමන් ඇරඹීම.

**ගමන් මග** - සා. ජෝශප් දෙව් මැදුර පමුණුගම, ඉන්පසු ඒපාමුල්ල, උස්වැටකෙයියාව, දික්ඕවිට හරහා පල්ලියවත්තට සේන්දු වීම. පිළිගැනීම පල්ලියවත්ත පාලම අසලදී. විශේෂ දිව්‍ය පූජාව සාගර ක්‍රීඩා පිටියේදී. ඉන්පසු සර්ව රාත්‍රික යැදුම් මෙහෙය ශුද්ධවූ ධාතුව ප්‍රදර්ශණය කෙරේ.

### 2011 නොවැම්බර් මස 21 වන සඳුදා

දොන් බොස්කෝ අහුන්ගල්ල බලා ගමන් ඇරඹීම.

**ගමන් මග** - සාන්ත ලුසියා ආසන දෙව් මැදුර කොටහේන.
- සාන්ත ලෝරන්ස් දෙව් මැදුර වැල්ලවත්ත. සාන්ත

# ගේ ශුද්ධවූ ධාතු ශ්‍රී ලංකාවේ

## 30 වන දා දක්වා

කිතුනු උරුමය



සෙබස්තියන් දෙව් මැදුර මොරටුව, සාන්ත ආනා දෙව් මැදුර බේරුවල - සාන්ත මරියා ආසන දේව මැදුර ගාල්ල ඉන්පසු දොන් බොස්-කෝ අහුංගල්ල.

### 2011 නොවැම්බර් මස 22 වන අඟහරුවාදා

උස්වැටකෙයියාව බොස්කෝ සෙවණ කරා ගමන් ඇරඹීම.

**ගමන් මග** - සා. ජෝසප් දෙව් මැදුර පයාගල, ශුද්ධාත්ම දෙව් මැදුර වාද්දුව, වික්ෂෝප මාතා දෙව් මැදුර. පානදුර, සාන්ත සෙබස්තියන් දෙව් මැදුර කඳාන, බොස්කෝ සෙවන ආයතනය සර්ව රාත්‍රික යැදුම් මෙහෙය. ශු. ධාතුව ප්‍රදර්ශණය කෙරේ.

### 2011 නොවැම්බර් මස 23 වන බදාදා

දොන් බොස්කෝ දංකොටුව දෙව්සත්හල දක්වා ගමන් ඇරඹීම.

**ගමන් මග** - ජපමාල දේව මාතා දෙව් මැදුර දෙහියාගාත, සාන්ත පේදුරු සහ පාවුලු දෙව් මැදුර කටුනායක, ශුද්දවූ ප්‍රැන්සිස් සාලෙස් දෙව් මැදුර කට්ටුව, පිළිගැනීම සාන්ත බෙනඩික් දේව මැදුර වයික්කාල, අනතුරුව බෝලවත්ත, ගෝනවිල ඔස්සේ දොන් බොස්කෝ දෙව් සත්හලට සැපත්වීම ඉන් පසු දිව්‍ය පූජාව සහ සර්ව රාත්‍රික යැදුම් මෙහෙය. ශු. ධාතුව ප්‍රදර්ශණය කෙරේ.

### 2011 නොවැම්බර් මස 24 වන බ්‍රහස්පතින්දා

දොන් බොස්කෝ නොච්චියාගම බලා ගමන් ඇරඹීම

**ගමන් මග** - සා. සෙබස්තියන් දෙව් මැදුර කටුනේරිය, සාන්ත ජෝසප් වැඩිහිටි නිවාසය ලංසිගම, කාර්මෙල් දේව මාතා ආසන දෙව් මැදුර හලාවත. සාන්ත මරියා දෙව් මැදුර මංගලඑළිය, වේලන්කන්නි දෙව් මැදුර තිල්අඩිය, කලාඔය ලූර්දු දේව මාතා දෙව් මැදුර අසලදී පිළිගැනිම. නොච්චියාගම දොන් බොස්-කෝ ආයතනයට සපැමිණිම. දිව්‍ය පූජාව සහ සර්ව රාත්‍රික යැදුම් මෙහෙය, ශුද්ධවූ ධාතුව ප්‍රදර්ශනය කෙරේ.

### 2011 නොවැම්බර් මස 25 වන සිකුරාදා

දොන් බොස්කෝ මුරුන්ගන් බලා ගමන් ඇරඹීම.

**ගමන් මග** - සා. ජෝසප් දෙව් මැදුර මැදවච්චිය, සාන්ත අන්තෝනි දෙව් මැදුර වෙට්ටික්කුලම්, මඩුපාර අසලදී පිළිගැනිම දොන් බොස්කෝ ආයතනය මුරුන්ගන්, ඉන්පසු අලවක්කෛයි, නානාට්ටන් සහ වන්කාලෙයි හරහා සාන්ත සෙබස්තියන් ආසන දෙව් මැදුර මන්නාරම, දිව්‍ය පූජාව සහ සර්ව රාත්‍රික යැදුම් මෙහෙය ශු. ධාතුව ප්‍රදර්ශනය කෙරේ.

### 2011 නොවැම්බර් මස 26 වන සෙනසුරාදා

දොන් බොස්කෝ මහනුවර බලා ගමන් ඇරඹීම.

**ගමන් මග** - සාන්ත අන්තෝනි දෙව් මැදුර වව්නියා, සාන්ත තෝමස් දෙව් මැදුර මාතලේ, දොන් බොස්කෝ ආයතනය මහනුවර, දිව්‍ය පූජාව සහ සර්ව රාත්‍රික යැදුම් මෙහෙය, ශු. ධාතුව ප්‍රදර්ශණය කෙරේ.

### 2011 නොවැම්බර් මස 27 වන ඉරිදා

දොන් බොස්කෝ මැටියගනේ දක්වා ගමන් ආරම්භය

**ගමන් මග** - දිව්‍ය පූජාව සාන්ත අන්තෝනි ආසන දේව මැදුර මහනුවර, - සාන්ත ආනා දෙව් මැදුර කුරුණෑගල, දොන් බොස්කෝ මැටියගනේ, දිව්‍ය පූජාව සහ සර්ව රාත්‍රික යැදුම් මෙහෙය ශු. ධාතුව ප්‍රදර්ශණය කෙරේ.

### 2011 නොවැම්බර් මස 28 වන සඳුදා

මීගමුව දොන් බොස්කෝ කාර්මික ආයතනය දක්වා ගමන් ඇරඹීම.

**ගමන් මග** - දොන් බොස්කෝ කොටදෙණියාව, සාන්ත මරියා දෙව් මැදුර බඩල්ගම, ශු. ප්‍රැන්සිස් සේවියර් දෙව් මැදුර හල්පේ, මිගමුව දොන් බොස්කෝ ආයතනයට සපැමිණිම. දිව්‍ය පූජාව සර්ව රාත්‍රික මෙහෙය. ශු. ධාතුව නොවැම්බර් 30 දක්වා මීගමුව දොන් බොස්කෝ ආයතනයේදී ප්‍රදර්ශණය කෙරේ. එහිදි දොන් බොස්කෝ ආයතනයේදී ප්‍රදර්ශණය කෙරේ. එහිදි දොන් බොස්කෝ මුනිතුමන්ට ගෞරව දැක්වීම සහ එතුමා පිළිබඳව ප්‍රදර්ශණය ගීත භාවනා සහ චිත්‍රපට ප්‍රදර්ශනය

### 2011 නොවැම්බර් මස 30 වන බදාදා

නැගෙනහිර අප්‍රිකාවේ කෙන්යාව බලා යන දොන් බොස්කෝ තුමාගේ ශු. ධාතුවට බුහුමන් පෙරදැරි කරගත් සමුදීම.

ශිරාන් මෛත්‍රි

# ඉංග්‍රීසි පාඩම
# විශේෂයෙන් අ.පො.ස. (සා. පෙළ හා උ. පෙළ)
# සිසු සිසුවියන් සඳහා



General English - Grammar Lessons by courtesy of ළමා ප්‍රදීපය

## පාඩම් අංක : 33

නැවත බලන්න.

| | |
|---|---|
| - If I ***were*** you | I ***would*** not do that. |
| - If I ***went*** to Colombo | I ***would*** not be here. |
| - If she ***were*** present | she ***would*** sing. |
| - If father ***built*** this house | I ***would*** own it. |

යනාදි වශයෙන් වැකියේ කොටස් දෙකම අතීත ස්වරූපයේ ක්‍රියා පදයකින් යුක්ත බව ඔබට පේනවා. මේ හැම වැකියකින්ම ප්‍රකාශ වන්නේ - මනඃකල්පිත අවස්ථාවක්, විය නොහැකි අවස්ථාවක් ගැන අදහසක් බව ඔබට පැහැදිලි ඇති.

(Subject (කරන පුද්ගලයා) ඒක වචන වුනත් බහුවචන වුනත් සමාන්‍යයෙන් බහුවචන ස්වරූපයෙන් ක්‍රියාව තිබෙන බව මතක තබාගන්න)

අපි "If" යොදන හැටි ගැනයි මේ දිනවල කතා කරන්නේ. ගිය සතියේ අපි මීට අදාළ **Conditional 1** සහ **Conditional 2** ගැන කතා කළා. මීළඟට අපි **Conditional 3** ගැන කතා කරමු.

## Conditional 3

මේකත් මනඃකල්පිත අතීත සිදුවීම් පිළිබඳ ප්‍රකාශ කරන වැකි රටාවක්.

අතීතයේදී යම් කිසි දෙයක් සිදුවී තිබුනා නම්, එහි ප්‍රතිඵලයක් වශයෙන් තවත් දෙයක් සිදුවීමට ඉඩ තිබුණා. කියන අදහස තමයි මේ **(Conditional 3)** වලින් කියැවෙන්නේ.

If I had been born in India, I would have been speaking in Hindi.
මම ඉන්දියාවේ ඉපදී සිටියො නම්, මම හින්දියෙන් කතාකරනවා වෙන්න තිබුණා. (මම ඉන්දියාවේ ඉපදුනේ නෑ - හින්දි කතාකරන්නෙත් නෑ)

If you had asked me, I would have told you.
ඔබ මගෙන් අහල තිබුණා නම්, මම ඔබට ඒක කියන්න තිබුණා. (ඔබ අහලත් නෑ - මම කියලත් නෑ)

If you had studied well, you would have passed the exam.
ඔබ හොඳින් පාඩම් කර තිබුණා නම්,
ඔබ හොඳින් විභාගය සමත් වෙන්න තිබුණා.
(ඔබ පාඩම් කරලත් නෑ - ඒ නිසා විභාගය සමත් වෙලත් නෑ)

If I had played tennis, I would have won.
මම ටෙනිස් ක්‍රීඩා කරල තිබුණා නම්, මට දිනන්න තිබුණා.

බලන්න මේ ඉහත වැකි දිහා. මෙම Conditional 3 එකේදී අපි මතක තබා ගත යුතු වැදගත්ම කරුණ, එම වැකිවල මුල් කොටස Past Perfect වලින් තිබෙන අතර අනිත් කොටසේත් සහකාර පදය අතීත ස්වරූපයෙන් (would) තිබිය යුතු අතර, එම මුල් කොටස Future Perfect වලින් තිබිය යුතුයි යන්නයි.

**මේ විදිහට මතක තබා ගන්න එතකොට ලේසියි.**

**1st Conditional** If + Present will + ක්‍රියා පදය
නිදසුන් (If + you come I will + give the book)

**2nd Conditional** If + Past would + ක්‍රියා පදය
නිදසුන් (If + I went to Colombo I would + buy the bus)

**3rd Conditional**
If + Past Perfect would have + past participle
නිදසුන් (If + we had studied would have + passed the exam)

දැන් අපි **1 st** සහ **2 nd Conditionals** පිළිබඳව අභ්‍යාසයක් කරමු.

වරහන් තුළ ඇති ක්‍රියා පදයේ වර්තමාන හෝ අතීත ස්වරූපය සුදුසු ලෙස යොදා හිස්තැන් පුරවන්න.

1. If you ______ her for money, she will give you. (ask)
ඔබ ඉල්ලුවොත් ඇය දේවි, ඇයගෙන් සල්ලි ඉල්ලුවොත් ඔබට ඇය දේවි.

2. If I _______(go) to the town, I will buy you a pen.
මම ටවුමට ගියොත්, මම ඔබට පෑනක් ගේනවා.

3. If I _______(sell) my car, I could get around Rs. Six hundred thousand.
මම කාරෙක වික්කනම් මට ලක්ෂ හයක් හොයන්න පුළුවන්. (ඒත් විකුණන්නෙ නෑ)

4. If I_____(have) money, I would buy that house.
මට සල්ලි තිබුණනම් මම ඒ ගේ ගන්නවා. (ඒත් සල්ලි නෑ)

5. If I _____ (go) by car, I would reach there in one hour.
මම කාරෙකේ ගියානම්, පැයෙන් යන්න පුළුවන්.

(නමුත් මම කාරෙකේ යන්නෙ නෑ)

6. If I ______(lose) my wedding ring, my wife would be upset.
මම කසාද මුද්ද නැතිකරගත්තොත්, මගේ බිරිඳ "අප්සෙට්" වේවි.
(මම මුද්ද නැතිකරගත්තෙ නෑ)

7. If I ______(was) a monkey, I would climb trees quickly.
මම වඳුරෙක් වුනා නම්, මමත් හොඳට ගස් නගිනවා.
(නමුත් මම වඳුරෙක් නෙමේ)

8. If this shirt_______(fit) you, take it.
මේ කමිසෙ හරි නම් ගන්න. (හරියන්න පුළුවන්)

9. If I ______coming (am) coming to your place, I will call you. මම ඔබේ ගෙදර එනවනම් "කෝල්" එකක් දෙන්නම්.

10. If you ______(speak) in Latin, I would not understand.
ඔබ ලතින් වලින් කතා කළානම් මට තේරෙන්නේ නෑ.

11. If you ______(give) me a tea. I will drink.
ඔබ මට තේ එකක් දුන්නොත්, මම බොනවා.

12. If you ______(tare) the book, you will have to pay me.
පොත ඉරුවොත් මට ගෙවන්න ඕන.

13. If you _____(come) early, we can go early.
ඔබ වේලාසනින් ආවොත් අපිට වේලාසනින් යන්න පුළුවන්.

14. If we________(have) a Jeep, we could go faster.
ජීප් එකක් තිබුණානං අපිට ඉක්මනට යන්න තිබුණා.
(ජීප් එකක් නෑ)

15. If today _______(is) Sunday, we could go to the beech.
අද ඉරිදා වුණා නම්, අපිට බීච් එකට යන්න තිබුණා. (අද ඉරිදා නෙමේ)

**3rd Conditionals** පිළිබඳව පහත සඳහන් අභ්‍යාසය කරමු.

16 නුවරඑළි ගියා නම් වැස්සට අහුවෙන්න තිබුණා.
If we (go)_____ to, we_______(get wet).
(අපි නුවරඑළි ගියෙත් නෑ, ඒ නිසා වැස්සට අහුවුනෙත් නැහැ)

17. අපි කලින් ගියා නම් දුම්රිය අල්ලගන්න තිබුණා.
If we_____(go) earlier, we _____(catch) the train.
(අපි කලින් ගියේ නෑ ඒ නිසා දුම්රිය අල්ලගන්න බැරිවුණා)

18. ඔයා පාඩම් කරලා තිබුණා නම්, විභාගෙ පාස්වෙන්න තිබුණා.
If you ______(study) well, you ______ pass the exam.
(ඔයා පාඩම් කරල තිබුණෙ නැහැ, ඒ නිසා විභාගෙ පාස්වුණේ නැහැ)

19. ඔබ ඔහුට කියල තිබුණා නම්, ඔහු ඒ පොත ගේන්න තිබුණා.
If you _____(tell), he ______(brings) that book.
(ඔබ ඔහුට කියල තිබුණේ නැහැ, ඒ නිසා පොත ගෙනල්ලා නැහැ)

20. ඔබ ගිය අවුරුද්දේ ඒ ගස පැල කළානම්, මේ වෙද්දි එය විශාල ගසක් වෙලා තියෙන්න තිබුණා.
If you _______ planted that tree last year, it ______ become a huge tree by now.
(ගිය අවුරුද්දෙ ගහ හිටවලා නැහැ, ඒ නිසා විශාල ගහක් වෙන්න විදිහක් නැහැ)

## අභ්‍යාසවල පිළිතුරු

වරහන් තුළ ඇති ක්‍රියා පදයේ වර්තමාන හෝ අතීත ස්වරූපය සුදුසු ලෙස යොදා හිස්තැන් පුරවන්න.

1. If you **ask** her for money, she will give you. (ask)
ඔබ ඇයගෙන් සල්ලි ඉල්លුවොත් ඔබට ඇය දේවි.

2. If I **go** (go) to the town, I will buy you a pen.
මම ටවුමට ගියොත්, මම ඔබට පෑනක් ගේනවා.

3. If I **sold** (sell) my car, I could get around Rs. Six hundred thousand.
මම කාරෙක වික්කනම් මට ලක්ෂ හයක් හොයන්න පුළුවන්. (ඒත් විකුණන්නෙ නෑ)

4. If I **had** (have) money, I would buy that house.
මට සල්ලි තිබුණනම් මම ඒ ගේ ගන්නවා. (ඒත් සල්ලි නෑ)

5. If I **went** (go) by car, I would reach there in one hour.
මම කාරෙකේ ගියානම්, පැයෙන් යන්න පුළුවන්. (නමුත් මම කාරෙකේ යන්නෙ නෑ)

6. If I **lost** (lose) my wedding ring, my wife would be upset.
මම කසාද මුද්ද නැතිකරගත්තොත්, මගේ බිරිඳ "අප්සෙට්" වේවි.
(මම මුද්ද නැතිකරගත්තෙ නෑ)

7. If I **were** (was) a monkey, I would climb trees quickly.
මම වඳුරෙක් වුනා නම්, මමත් හොඳට ගස් නගිනවා. (නමුත් මම වඳුරෙක් නෙමේ)

8. If this shirt **fits** (fit) you, take it. මේ කමිසෙ හරි නම් ගන්න. (හරියන්න පුළුවන්)

9. If **I am** coming (am) coming to your place, I will call you.
මම ඔබේ ගෙදර එනවනම් "කෝල්" එකක් දෙන්නම්.

10. If you **spoke** (speak) in Latin, I would not understand.
ඔබ ලතින් වලින් කතා කළානම් මට තේරෙන්නේ නෑ.

11. If you **give** (give) me a tea, I will drink.
ඔබ මට තේ එකක් දුන්නොත්, මම බොනවා.

12. If you **tear** (tear) the book, you will have to pay me.
පොත ඉරුවොත් මට ගෙවන්න ඕන.

13. If you **come** (come) early, we can go early.
ඔබ වේලාසනින් ආවොත් අපිට වේලාසනින් යන්න පුළුවන්.

14. If we **had** (have) a Jeep, we could go faster.
ජීප් එකක් තිබුණානං අපිට ඉක්මනට යන්න තිබුණා. (ජීප් එකක් නෑ)

15. If today **were** (is) Sunday, we could go to the beech.
අද ඉරිදා වුණා නම්, අපිට බීච් එකට යන්න තිබුණා. (අද ඉරිදා නෙමේ)

## 3rd Conditionals පිළිබඳ අභ්‍යාසයට පිළිතුරු

16 අපි නුවරඑළි ගියා නම් වැස්සට අහුවෙන්න තිබුණා.
If we (go) **had gone** to Nuwara Eliya, we **would have got** wet. (get wet)
(අපි නුවරඑළි ගියෙත් නෑ, ඒ නිසා වැස්සට අහුවුනෙත් නැහැ)

කරුණාකර 14 පිටුව බලන්න

## අපගේ දිව්‍ය භෝජනය



**ෂෙරෝන් ප්‍රබෝධ**
5 ශ්‍රේණිය,
සා. අන්තෝනි දහම් පාසල,
නයිනමඩම.

## ජීවමාන ජේසු සමිඳාණෝ



**කවිඳු ඉදුර මදුෂාන්**
9 ශ්‍රේණිය,
ආරෝග්‍ය දේව මාතා මාතා
දහම් පාසල, පොල්ගහඅගාර
දුනකදෙනිය මීසම

## අන් අයට උදව් කරමු



**රොසෙල්ලා ක්‍රිෂානි ප්‍රනාන්දු**
5 ශ්‍රේණිය,
සා. මරියා ප්‍රාථමික
බාලිකා විදුහල
හලාවත

## මල් පෝච්චිය



**කේ.එස්. සුභාෂිනි දිල්රුක්ෂිකා**
8 ශ්‍රේණිය,
මහානාම විද්‍යාලය,
බණ්ඩාරවෙල

## පරිසරය සුරකිමු



**ජී.වී. ඉමෝෂ් එමල්ෂන්**
4 ශ්‍රේණිය,
මාරිස් ස්ටෙල්ලා විදුහල,
මීගමුව.

### පුංචි අපේ චිත්‍ර පිටුව

පුංචි අපේ චිත්‍ර පිටුව සඳහා ඔබ අඳින චිත්‍ර, පාසලේ හෝ දහම් පාසලේ පංතිභාර ගුරුතුමාගේ සහතිකය සමග ඔබේ නම. පංතිය. පාසල ඇතුළත්ව ඔබේ පෞද්ගලික ලිපිනය හා දුරකතන අංකය ද සහිතව යොමු කරන්න.
"පුංචි අපේ චිත්‍ර පිටුව" ළමා ප්‍රදීපය,
අංක 02,
ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08.

## මෝස්තරයක්



**පසිඳිනා සංදීපනී පෙරේරා**
2 ශ්‍රේණිය,
ශු. ඌගෝ මුනි දහම් පාසල - බුරුල්ලපිටිය

## මුහුදු වෙරළෙහි අසිරිය



**ක්‍රිස්ටන් ප්‍රනාන්දු**
2 ශ්‍රේණිය,
ආවේ මරියා බාලිකා විදුහල,
මීගමුව

## මා දුටු තේවත්ත බැසිලිකාව



**ෂෙනල් දිමුතු සංදීප**
1 ශ්‍රේණිය, පාතිමා දහම් පාසල,
යායමුල්ල (වල්පිටගම මීසම)

## දිනයක ඇරඹුම



**දයාන් සචින්තන**
5 ශ්‍රේණිය, සා. මරියා දහම් පාසල,
හාල්දඬුවන.



## පළමු වරට දිව බොදුන් ලැබීම

### අගරදගුරු පදවිය



කලමුල්ල මීසමේ දහම් පාසල්හි ළමුන් 93 දෙනෙකු හට පළමු වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දානය කිරීම මීසම් පාලක ගරු මොරිස් නාමල්, සහයක ගරු රුවන්ත ප්‍රනාන්දු පියතුමන්ලාගේ ප්‍රධානත්වයෙන් කලමුල්ල දේව මාතා දේවමැදුරේදී පැවැත්විණ. ගරු පියතුමන්ලා සහ ළමුන් පුහුණු කළ ගරු පැවිදි සොහොයුරියන් දහම් පාසල් ගුරුභවතුන් සමූහ සේයාරුවට පෙනී සිටි අයුරු.

**සටහන : ඇන්ටනි ප්‍රනාන්දු, සේයා : ස්ටුඩියෝ රනිල් )**



කැපුන්ගොඩ සාන්ත අන්තෝනි දෙව් මැදුරට අයත් දහම් පාසලේ දරු දැරියෝ 53 දෙනෙක් පසුගියදා පළමුවරට දිව්‍ය ස්තප්‍රසාද වහන්සේ ලබා ගත්හ.

කැපුන්ගොඩ මීසම්පති ගරු ක්ලෝඩ් වනසිංහ පියතුමා, එම අවස්ථාවට සහභාගීවූ ගරු හේමන්ත ප්‍රනාන්දු පියතුමා සමග දරුවන් සූදානම් කළ ගරු පැවිදි සොයුරියන් දහම් ගුරු භවතුන් සමග දරු දැරියෝ සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු.

**(සටහන - ඇන්ටනි පෙරේරා, ඡායාරූපය - ඩිවෝන් පෙරේරා)**



අවිස්සාවේල්ල මීසමේ පුවක්පිටිය, කොල්පින් හා අවිස්සාවේල්ල දේවස්ථානයන්හි දරු දැරියෝ 28 ක් අවිස්සාවේල්ල සා. මරියා දෙව්මැදුරේදී පසුගියදා ප්‍රථමවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගත්හ. දිව්‍ය යාගයෙන් අනතුරුව අවිස්සාවේල්ල මීසම් සේවක ගරු මැක්සිමස් රුදිගුපුල්ලේ පියතුමා අවිස්සාවේල්ල මීසම් සහයක ගරු ටෙරන්ස් ප්‍රසංග පියතුමා, බලංගොඩ මීසම් සහයක ගරු ඇන්ටන් මොරිස් පියතුමා ගරු පැවිදි සොහොයුරිය හා ළමුන් පුහුණු කළ ගුරුවරියන් සමග සමූහ ඡයාරූපයකට එක්වූ අවස්ථාව මෙහි දැක්වේ. **(ඇන්තනි හෙට්ටිආරච්චි )**

# බුරුල්ලපිටිය ශු. ඌගෝ මුනිඳුන්ගේ දහම් පාසල

බුරුල්ලපිටිය මීසමට අයත් බුරුල්ලපිටිය ශු. ඌගෝ මුනිඳුන්ගේ දහම් පාසලේ සිසු දරු දැරියෝ 350 ක් පමණ අධ්‍යාපනය ලබති. සෑම ඉරිදා දිනකම උදෑසන දිව්‍ය පූජාවන් පසුව දහම් පාසල් ගීතය ගායනා කිරීමෙන් අනතුරුව දහම් පාසල ආරම්භ කෙරේ.



මීසම් සේවක පියතුමා සමඟ ආචාර්ය මඩුල්ල

මෙහි පෙර පාසලේ සිට 11 ශ්‍රේණිය දක්වා පන්ති පැවැත්වේ. මීසම් සේවක ගරු සුභාෂ් චමින්ද නි.ම.නි. පියතුමාගේ අධික්ෂණය යටතේ, ගරු අසුන්ටා ප්‍රනාන්දු පැවිදි සොයුරියගේ සහයෙන් දහම් පාසලේ කටයුතු සිදු කෙරෙන අතර විදුහල්පතිනිය ලෙස සුසන් ප්‍රනාන්දු ගුරු මහත්මිය කටයුතු කරනු ලබයි. මෙහි ගුරුවර ගුරුවරියෝ 15 දෙනෙකු දරුවන්ගේනැණස පැදීමට කැපවීමෙන් කටයුතු කරනු ලබයි.



ජ්‍යෙෂ්ඨ අංශයේ ළමුන්




**සටහන - ලක්ශාන් ප්‍රනාන්දු,**
**සේයා - සිතිල මැන්ඩිස්**



කනිෂ්ඨ අංශයේ ළමුන්

11 පිටුවෙන්

17. අපි කලින් ගියා නම් දුම්රිය අල්ලගන්න තිබුණා.
If ***we had gone*** (go) earlier, we ***would have caught*** (catch) the train.
(අපි කලින් ගියේ නෑ ඒ නිසා දුම්රිය අල්ලගන්න බැරිවුණා)

18. ඔයා පාඩම් කරලා තිබුණා නම්, විභාගෙ පාස්වෙන්න තිබුණා.
If you ***had studied*** (study) well, you ***would have passed*** (pass) the exam.
(ඔයා පාඩම් කරල තිබුණෙ නැහැ, ඒ නිසා විභාගෙ පාස්වුණේ නැහැ)

19. ඔබ ඔහුට කියල තිබුණා නම්, ඔහු ඒ පොත ගේන්න තිබුණා.
If you ***had told*** (tell), he ***would have brought*** (bring) that book.
(ඔබ ඔහුට කියල තිබුණේ නැහැ, ඒ නිසා පොත ගෙනල්ලා නැහැ)

20. ඔබ ගිය අවුරුද්දේ ඒ ගස පැල කළානම්, මේ වෙද්දි එය විශාල ගසක් වෙලා තියෙන්න තිබුණා.
If you ***had planted*** (plant) that tree last year, it ***would have become*** (become) a huge tree by now.
(ගිය අවුරුද්දෙ ගහ හිටවලා නැහැ, ඒ නිසා විශාල ගහක් වෙන්න විදිහක් නැහැ)

**ළමා ප්‍රදීපය 2011 නත්තල් කලාපය....**

**ළමා ප්‍රදීපය 2011 නත්තල් කලාපය සඳහා පිටකවර සිතුවම සිත්තම් කිරීමට අවස්ථාවක් ළමා ඔබට ලබා දීමට අපි තීරණය කළෙමු. වැඩි විස්තර ලබන සතියේ...**

**සංස්කාරක පියතුමා**



## අපි වෙමු කිතුනු ළමුන් හඳුනාගනිමු



**නම** - රමීෂා ද සිල්වා

**ශ්‍රේණිය** - 5 ශ්‍රේණිය

**දහම් පාසල** - සා. රීටා දහම් පාසල තල්දෙක

**කුසලතා** - චිත්‍ර, නර්තනය

## අපි වෙමු කිතුනු ළමුන්

ළමා ප්‍රදීපය

නම :- ......................................................................

ලිපිනය :- ......................................................................

පාසල :- ......................................................................

පංතිය :- ......................................................................

උපන් දිනය :- ...................... නිවසේ දු. අ. ..................

දහම් පාසල :- ......................................................................

මීසම :- ......................................................................

සහභාගි වන සමිති සමාගම් :- .......................................

කුසලතා දක්වන ක්ෂේත්‍රය :- .......................................

(කවි කෙටි කතා. චිත්‍ර චාර්තා, වෙනත් )

අපි වෙමු කිතුනු ළමුන් වැඩ සටහනට මා ද ඇතුළත් කර ගන්න.

.................................... ..........................

අත්සන දිනය

**අපි වෙමු කිතුනු ළමුන් ළමා පාඨක එකමුතුවේ ලියාපදිංචි වීමට ඔබත් කැමති නම් ඉහත ළමා ප්‍රදීපය ලාංඡනය සහිත පත්‍රිකා තුනක් එකතු කර අයැදුම් පත්‍රය පුරවා 2x2 ප්‍රමාණයේ ඡායාරූපයක් සමග අපි වෙමු කිතුනු ළමුන්, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08 ලිපිනයට තැපැල් කරන්න.**

## ප්‍රහේළිකා අංක 27



### හරහට

1. සැම දේටම වඩා වැදගත් වන්නේ ප්‍රේමය බව ශු. පාවුළුතුමා මොවුන්ට යවන ලද පළමු ලිපියෙහි සඳහන් වේ.
4. ශු. ලියවිල්ලේ සළමොන්ගේ ප්‍රඥාව පොතේ පවසන්නේ, ප්‍රඥාව මෙයට වඩා අගනා බවයි.
5. ක්‍රිස්තුන් වහන්සේ මෙය මතදී අප වෙනුවෙන් දිවිපිදූ සේක.
7. ........... ක් නැති ඉඩම කොල්ලකනු ලබන්නේයැයි උපදේශකයා හෙවත් සිරාක් පවසයි. මෙහි හිස්තැනට සුදුසු වචනය.
8. ස්නාවක ජුවාම් තුමාගේ පියා

### පහළට

1. ක්‍රිස්තුන් වහන්සේගේ උත්ථානයට පසුව ප්‍රදර්ශන දොරටුව අසල සිටි මෙවැන්නෙකු පේදුරු තුමා සුව කළේය.
2. ක්‍රිස්තුන් වහන්සේ උකුත් වන විට දේව මාළිගාවේ මෙය දෙකඩව ඉරීගිය බව ශු. ලියවිල්ලේ සඳහන් වෙයි.
3. රන්කාසි දසය පිළිබඳ උපමාවේ, ස්වාමියා රාජ පදවියක් ලබන පිණිස මෙහි ගිය බව පැවසේ.
6. තම අසල්වැසියා හඳුන්වාදීම සඳහා ක්‍රිස්තුන් වහන්සේ මෙම ජාතිකයාගේ උපමාව වදාළ සේක.
8. එළියා දිවැසිවරයා එම රටේ වූ තුන් අවුරුදු නියගය නිම කරමින්, දෙවියන් වහන්සේ සැබෑවූ එකම දෙවියන් වහන්සේ බව මිනිසුන්ට පෙන්වමින් මෙය ලබා දුන්නේය.

(මෙම ප්‍රහේළිකාව පිරවීමේදී පහත සඳහන් පරිච්ඡේදය ආධාර කරගත හැකිය. ශු. ලූක් 10,19, 23 පරිච්ඡේද, ක්‍රියා 3, ශු. මතෙව් 5, 1 රාජාවලිය 17, සලමොන්ගේ ප්‍රඥාව 7, උපදේශකයා හෙවත් සිරාක් 36, 1 කොරින්ති 13)

**නිවැරදිව ප්‍රහේළිකාව පුරවා තැපැල් පත් මගින් පමණක්, ප්‍රහේළිකා අංක 26, ළමා ප්‍රදීපය, අංක 02, ඥානාර්ථ ප්‍රදීපය මාවත, කොළඹ 08 යන ලිපිනයට එවන්න.**

**( සැකසුම - තිළිණි දුතිකා පෙරේරා )**

**ප්‍රහේළිකා අංක 26 පිළිතුරු හා ප්‍රහේළිකා අංක 27 ලබන සතියේ පළ වේ.**

# ගැලවුම්කාර ජේසු

48 කොටස

ශු. ජුවාම්තුමාගේ සුවිශේෂයෙන්

සැකසුම : තිළිණ අලහකෝන්




කොළඹ 08, ඥානාර්ථ ප්‍රදීපය මාවත, අංක 2 හී, ගරු සී.ඩී. සී. රොහාන් ද අල්විස් පියතුමන් විසින් එහිම කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කොට ප්‍රසිද්ධ කරන ලදී.
සංස්කාරක ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා